ucation,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විෂය - නාට්‍ය හා රංග කලාව

සැකසුම - සරසි පීරිස්

ශ්‍රේණිය - 12 වසර

සති පාසල් වැඩසටහන

පළමු වාරය-පළමු සතිය

කාර්ය පත්‍රිකාව

නිපුණතාව 1.0 : කලාව යන්න විමසමින් නාට්‍ය හා රංග කලාව අනෙකුත් කලා සමග සංසන්දනය කරයි

නිපුණතා මට්ටම 1.2- ප්‍රසාංගික කලාව හඳුන්වයි

01. පහත කලා අතරින් ප්‍රාසාංගික ප්‍රාසාංගික කලාවන්ට අයත් කලාවන් ඇතුළත් නොවන වරනය වන්නේ
   i. වේදිකා නාට්‍ය ,නර්තනය, බැලේ, ඔපෙරා
   ii. මූර්ති, කැටයම්, චිත්‍ර, නර්තනය
   iii. වේදිකා නාට්‍ය, සංගීතය, බැලේ, නර්තනය
   iv. වේදිකා නාට්‍ය ,නර්තනය, ඔපෙරා

02. නර්තනයේදී අත්‍යවශ්‍යයෙන් අත්‍යවශ්‍යයෙන් ම භාවිතා නොවන අභිනය වන්නේ
   i. ආංගික අභිනය
   ii. සාත්වික අභිනය
   iii. ආහාර්ය අභිනය
   **iv.** වාචිකාභිනය
   v.

03. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සම්බන්ධව වැරදි ප්‍රකාශය වන්නේ
   i. සාත්වික අභිනය යොදා ගනී
   ii. ප්‍රේක්ෂක සහභාගිත්වය අනිවාර්ය වේ
   iii. සංගීතය නර්තනය යොදා ගනියි
   iv. අනුශාංගික අංග අවශ්‍ය නොවේ

04. වේදිකා නාට්‍ය සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වන්නේ
   i. සාමූහික කලා මාධ්‍යකි
   ii. ප්‍රාසාංගික කලා මාධ්‍යකි
   iii. සතර අභිනය අනිවාර්යය වේ
   iv. පිටපතක් අවශ්‍ය නොවේ

05. වේදිකා නාට්‍ය කලාවට අදාළ ශිල්පියෙක් නොවන්නේ
   i. නළුවන්
   ii. අධ්‍යක්ෂක
   iii. කැමරා ශිල්පීන්
   iv. අනුශාංගික ශිල්පීන්

කෙටි පිළිතුරු සපයන්න.

**6.**ප්‍රාසාංගික කලාව යනු කුමක්ද?

**7.**ප්‍රාසාංගික කලාවේ මූලික ලක්ෂණ දෙකක් ලියන්න

**8.**රූපගත කරන ලද නර්තන ප්‍රසංගයක් ප්‍රාසාංගික කලාවක් නොවන්නේ ඇයි?

**9.**ප්‍රාසාංගික කලාවට අයත් වන කලාවන් හතරක් ලියන්න

**10.**ප්‍රාසාංගික කලාවට අයත් නොවන කලාවන් හතරක් ලියන්න

**11.**

   i. ප්‍රසාංගික කලාව පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න
   ii. ප්‍රාසාංගික කලාව අනෙකුත් කලා මාධ්‍යයන් මාධ්‍යන් අතරින් වෙනස් වීමට හේතු සංසන්දනය කරන්න
   iii. අනෙකුත් කලා මාධ්‍යන් අතරින් ප්‍රාසාංගික කලාව සුවිශේෂී සුවිශේෂී වීමට හේතු එක් කලා මාධ්‍යයක් ඇසුරෙන් විස්තර කරන්න

**12.**

   i. ප්‍රාසාංගික කලා නොවන මාධ්‍යයන් 3ක් විස්තර කරන්න
   ii. නර්තන ප්‍රසංග, සංගීත ප්‍රසංග ආදී රූපගට කර පෙන්වන කලාවන් ප්‍රාසාංගික කලා නොවීමට හේතු පහදන්න
   iv. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් ලෙස නාට්‍ය කලාව සුවිශේෂී වීමට කරුණු සැකවින් විස්තර කරන්න